මහේස්ත්‍රාත් අධිකරණය
3 ... 1987
අනුරාධපුරය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1987 මැයි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 මැයි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1987 මැයි මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 44/82.

**රාජ්‍ය සංස්ථා හෝ 1971 අංක 35 දරන ව්‍යාපාර ආයතන (අත්කර ගැනීමේ) පනත යටතේ අත්කර ගන්නා ලද ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන, පොදු සමාගම් බවට පරිවර්තනය කිරීම සඳහා සහ ඊට අදාළ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

1. මේ පනත 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සංස්ථාවක් හෝ ආණ්ඩුව සතු ව්‍යාපාර ආයතනයක් කරගෙන යාම සඳහා සමාගමක් පිහිටුවීම.

2. (1) යම් රාජ්‍ය සංස්ථාවක හෝ එහි යම් කොටසක කර්තව්‍ය භාර ගැනීමේ කාර්යය සඳහා හෝ 1971 අංක 35 දරන ව්‍යාපාර ආයතන (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව විසින් අත්පත් කරගන්නා ලද හෝ ආණ්ඩුව සතුකර ගන්නා ලද යම් ව්‍යාපාර ආයතනයක් හෝ එහි යම් කොටසක් භාර ගැනීමේ හා කරගෙන යාමේ කාර්ය සඳහා සමාගමක් සංස්ථාගත කිරීම අවශ්‍ය වේ යයි අමාත්‍ය මණ්ඩලය සලකන අවස්ථාවක, මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින්, ඒ රාජ්‍ය සංස්ථාව හෝ ව්‍යාපාර ආයතනය හෝ එහි යම් කොටස 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලෙස සමාගම් රෙජිස්ට්‍රාර් වෙත කෙරෙන විධානයක් ද සමග සංස්ථා පත්‍රයක් සහ සාංගමික ව්‍යවස්ථාවලියක් සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) 1982 අංක 17 දරන සමාගම් පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් වුව ද (1) වන උපවගන්තිය යටතේ වූ විධානයක් තමා වෙත ලැබුණු විට, සමාගම් රෙජිස්ට්‍රාර් විසින්—

(i) (1) වන උපවගන්තිය යටතේ වූ විධානයේ සඳහන් කර ඇති නාමයෙන්, 1982 අංක 17 දරන සමාගම් පනතේ 15 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය; තවද

(ii) නියමයේ නිශ්චිතවම සඳහන් රාජ්‍ය සංස්ථාවේ කර්තව්‍ය භාර ගැනීම සඳහා හෝ නියමයේ නිශ්චිතව සඳහන් සංස්ථාවේ යම් කොටසක් භාර ගැනීම සඳහා වූ හෝ ඒ නියමයෙහි නිශ්චිතවම සඳහන් ව්‍යාපාර ආයතනය හෝ ඒ නියමයෙහි නිශ්චිතවම සඳහන් ඒ ව්‍යාපාර ආයතනයේ යම් කොටසක් භාර ගැනීම සහ කරගෙන යාම සඳහා නියමයේ නිශ්චිතවම සඳහන් නාමයෙන් පොදු සමාගමක් සංස්ථාගත කරන ලද බව ප්‍රකාශ කරමින් ගැසට් පත්‍රයෙහි නියමයක් පළකරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් නියමය ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු, සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සමාගමේ කොටස් අරමුදල බෙදන ලද්දේ යම් කොටස් ගණනකට ද ඒ කොටස් සියල්ලම, රජය සඳහා සහ ඒ වෙනුවෙන් ඔහුගේ නිලනාමය මත භාණ්ඩාගාරයේ ලේකම් වෙත වෙන් කර දිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ භාණ්ඩාගාරයේ ලේකම්වරයාට කොටස් වෙන් කර දීම මත 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත යටතේ කිසිම මුද්දර ගාස්තුවක් ගෙවනු නොලැබිය යුතු ය.

අවශ්‍ය‍ථාවෝචිත පරිදි සංස්ථාව හෝ ව්‍යාපාර ආයතනය සමාගම වෙත සතු කිරීම.

3. (1) 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ නියමය ගැසට් පත්‍රයේ පළ කිරීමට යෙදෙන (මේ වගන්තියෙහි "අදාළ දිනය" ලෙස හඳුන්වනු ලබන) දිනයේ සිට අවශ්‍යථාවෝචිත පරිදි නියමය අදාළ වන සංස්ථාව හෝ ව්‍යාපාර ආයතනය හෝ එහි කොටස ඒ නියමයේ සඳහන් සමාගම වෙත මුළුමනින්ම සතු විය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා

"සංස්ථාව" යන්නෙන්—

(අ) අදාළ දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංස්ථාවට අයත්ව තිබූ සහ සංස්ථාවේ කාර්ය සඳහා භාවිතා කරන ලද්දා වූ චංචල හෝ නිශ්චල සියලු දේපළ ද;

(ආ) ඒ දේපළවලින් ඇතිවන හෝ පැන නගින සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද සහ සම්බන්ධතා සහ ඒ සංස්ථාවේ සියලු බැරකම් ද;

(ඇ) සංස්ථාවට හෝ සංස්ථාවේ යම් දේපළකට අදාළ වන්නා වූ හෝ සම්බන්ධකමක් ඇත්තා වූ සියලු පොත්, ගිණුම් සහ ලේඛන ද

අදහස් වේ.

"ව්‍යාපාර ආයතනය" යන්නෙන් —

(අ) අදාළ දිනයට පෙරාතුවම වූ දිනයේ දී ඒ ආයතනයේ කාර්ය සඳහා භාවිත කරනු ලැබූ සහ රජය සතු වූ සියලු චංචල හෝ නිශ්චල දේපළ ද;

(ආ) ඒ දේපළවලින් හෝ ව්‍යාපාරයෙන් ඇති වන හෝ පැන නගින සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද සහ සම්බන්ධතා සහ ඒ ආයතනයේ සියලු බැරකම්;

(ඇ) ව්‍යාපාර ආයතනයට හෝ ඒ ආයතනයේ යම් දේපළකට අදාළ වන්නා වූ හෝ සම්බන්ධකමක් ඇත්තා වූ සියලු පොත්, ගිණුම් සහ ලේඛන ද

අදහස් වේ.

(2) (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොවන පරිදි—

(අ) (i) සංස්ථාවට අයත් ; හෝ

(ii) රජය සතු වූ

සහ අවස්ථාවෝචිත පරිදි, අදාළ දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංස්ථාවේ හෝ ව්‍යාපාර ආයතනයේ කාර්ය සඳහා භාවිතා කරන ලද සහ 2 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ කරන ලද නියමයෙහි නිශ්චිතව සඳහන් චංචල හෝ නිශ්චල සියලු දේපළ අදාළ දිනයේ සිට සමාගම සතු විය යුතු ය ;

(ආ) අදාළ දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවැතියා වූ සහ 2 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ කරන ලද නියමයෙහි නිශ්චිතව සඳහන් අවස්ථාවෝචිත පරිදි ඒ සංස්ථාවේ හෝ ව්‍යාපාර ආයතනයේ සියලු බැරකම් අදාළ දිනයේ සිට, ඒ සමාගමේ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) (i) සමාගම විසින් සේවා නියුක්තිය පිරිනමනු නොලැබූ, අදාළ දිනයට පෙරාතුවම වූ දිනයෙහි සංස්ථාවේ සියලු නිලධරයෝ හා සේවකයෝ, අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් වන්දියක් ගෙවනු ලැබීමට හිමිකම් ලබන්නාහ ; තවද

(ii) සමාගම විසින් සේවා නියුක්තිය පිරිනමනු නොලැබූ, අදාළ දිනයට පෙරාතුවම වූ දිනයෙහි ව්‍යාපාර ආයතනයේ සියලු නිලධරයෝ හා සේවකයෝ අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් වන්දියක් ගෙවනු ලැබීමට හිමිකම් ලබන්නාහ ;

(ඈ) අදාළ දිනයට පෙරාතුව වූ දිනයෙහි පැවති සහ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයෙහි නිශ්චිතව සඳහන්, අවස්ථාවෝචිත පරිදි, ඒ සංස්ථාවේ හෝ ව්‍යාපාර ආයතනයේ කාර්යය සඳහා ඇතුළත් වූ සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් අදාළ දිනයේ සිට සමාගම විසින් ඇතුළත් වූ කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය ; සහ

(ඉ) අදාළ දිනයට පෙරාතුවම වූ දිනයෙහි විනිශ්චයට භාජනව පැවතියා වූ හා 2 වන වගන්තියේ (2) උපවගන්තිය යටතේ කරන ලද නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇත්තා වූ ද—

(අ) සංස්ථාව විසින් හෝ ඊට විරුද්ධව ; හෝ

(ආ) ව්‍යාපාර ආයතනය විසින් හෝ ව්‍යාපාර ආයතනය නියෝජනය කරන්නා වශයෙන් නීතිපතිවරයා විසින් නැතහොත් එම ආයතනයට හෝ නීතිපතිවරයාට විරුද්ධව හෝ

පවරනු ලැබ ඇත්තා වූ ද, සියලු නඩු සහ නඩු කටයුතු අදාළ දිනයේ සිට ඒ සමාගම විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරන ලද නඩු හෝ නඩු කටයුතු හෝ ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඊ) සංස්ථාවක් හෝ ව්‍යාපාර ආයතනයක් (1) වන උපවගන්තිය යටතේ සමාගමක් සතුවීමෙන් උද්ගත වන යම් ලාභ සහ ආදායම් කිසිවක් වෙතොත් ඒ ලාභ සහ ආදායම්—

(අ) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 7 වන වගන්තියේ අර්ථානුකූලව ඒ සංස්ථාවේ හෝ ආයතනයේ ප්‍රාග්ධන ලාභයක් ;

(ආ) ඒ පනතේ 23 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ අර්ථානුකූලව ඒ සංස්ථාවේ හෝ ආයතනයේ වෙළඳාමෙන් ලැබෙන ලාභයක්

ලෙස සලකනු නොලැබිය යුතු ය ;

(උ) රාජ්‍ය සංස්ථාවක් හෝ ව්‍යාපාර ආයතනයක් (1) වන උපවගන්තිය යටතේ සමාගමක් වෙත සතු කරනු ලැබූ අවස්ථාවක—

(i) යම් තක්සේරු වර්ෂයක දී එහි ව්‍යවස්ථාපිත ආදායමට ප්‍රතිපක්ෂව හිලව් කරනු නොලැබූ, ඒ සංස්ථාව හෝ ව්‍යාපාර ආයතනය විසින් දරන ලද යම් පාඩුවක්, ඒ සමාගම විසින් දරන ලද පාඩුවක් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ii) ඒ සතු කිරීම සිදු කරනු ලබන්නේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ දී ඒ සංස්ථාව හෝ ව්‍යාපාර ආයතනය විසින් දරන ලද යම් ප්‍රාග්ධන පාඩුවක් ඒ සමාගම විසින් දරන ලද ප්‍රාග්ධන පාඩුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන ඊත් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.